**F3**

# කොන්දේසි

රජයේ සියලුම දෙපාර්තමේන්තු / සංස්ථා /අධිකාරි /ව්‍යවස්ථාපිත ආයතන වල ස්ථිර සේවකයින් හට රාජ්‍ය දැව සංස්ථාවේ නිෂ්පාදිත ගෘහ භාණ්ඩ ණය පදනම මත (වාරික ගෙවීමේ පදනම මත) නිකුත් කිරීම සඳහා අදාල කොන්දේසි

රජයේ සියලුම දෙපාර්තමේන්තු / සංස්ථා /අධිකාරි / මණ්ඩල/ ව්‍යවස්ථාපිත ආයතන වල ස්ථිර සේවකයින් හට රාජ්‍ය දැව සංස්ථාවේ නිෂ්පාදනය කරනු ලබන ගෘහ භාණ්ඩ ණය පදනම නිකුත් කිරීමට 2010-03-04 දින පැවති අධක්ෂ මණ්ඩල රැස්වීමේදි අනුමත කර ඇත.

දැනට සියලුම සේවකයින්ට අනුමත මෙම යෝජිත ක්‍රමය ගරු පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍යතුමාගේ උපදෙස් පරිදි මෙසේ රජයේ සියලුම දෙපාර්තමේන්තු / සංස්ථා /අධිකාරි /ව්‍යවස්ථාපිත ආයතන වල වයස අවු:55 ට නොවැඩි ස්ථිර සේවකයින් හට රු.100000/= උපරිමයකට රාජ්‍ය දැව සංස්ථාවේ නිෂ්පාදිත දැව භාණ්ඩ 10% වාර්ෂික පොලිය සමග වාරික 24 කින් ගෙවා නිම කිරීමේ පදනම මත නිකුත් කිරීමට අනුමැතිය ලැබී ඇත.

මෙම ණය පහසුකම් ලැබීම සඳහා පහත සඳහන් කොන්දේසි අදාල ගැනුම්කරු විසින් සපුරා තිබිය යුතුය.

01. රජයේ සියලුම දෙපාර්තමේන්තු / සංස්ථා /අධිකාරි / මණ්ඩල /ව්‍යවස්ථාපිත ආයතන හා පිළිගත් ආයතන වල ස්ථිර සේවකයකු විය යුතුය.

02 අයදුම්කරු කිසියම් විනයානුකූල ක්‍රියාවකට භාජනය නොවිය යුතු අතර, ඒ බැව් අදාල ආයතන ප්‍රධානියා / අංශ ප්‍රධානියා විසින් සහතික කළ යුතුය.

03. ණය අත්තිකාරම් මුදලේ උපරිමය රු.100,000/- (එක් ලක්‍ෂය)ක් වන අතර, එය උපරිම වාරික 24 කින් ගෙවිය යුතුය.
(සේවකයාගේ වයස් සීමාව අනුව වාරික ගණන වෙනස් විය හැකිය)

04. ද්විතීය පදනම මත හෝ කොන්ත්‍රාත් පදනම මත සේවය කරන සේවකයින්ට මෙම ව්‍යාපෘතිය යටතේ දැව භාණ්ඩ මිළදී ගැනීමට හිමිකම් නොලැබේ.

05. ගෘහ භාණ්ඩ ණය මුදල ලබා ගැනීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් රාජ්‍ය දැව සංස්ථාවේ නි.සා.(අලෙවි) ගේ කාර්යාලයෙන් අදාල අයදුම්පත ලබාගත යුතුය.

06. එසේ ලබාගන්නා ලද අයදුම්පත හා ඇපකරු ප්‍රකාශන නිවැරදිවත්, පැහැදිලිවත්, සම්පූර්ණ කර සිය අංශ ප්‍රධානී මගින් නි.සා.(අලෙවි) වෙත එවිය යුතුය.

07. ණය ලබා ගැනීම සඳහා සුදුසුකම් සපුරාලන ඉල්ලුම්පත් සාමාන්‍යාධිකාරිගේ නිර්දේශය මත සංස්ථාවේ සභාපති තුමා වෙත අනුමත කිරීම සඳහා ඉදිරිපත් කරනු ලැබේ.

08. මෙම ණය පහසුකම් ලබා ගන්නා ලද සේවකයින් තමාගේ සේවාව යම් අයුරකින් අවසන් කරනු ලබන්නේ නම් සේවය අවසන්වීමට ප්‍රථම ණය මුදලේ ඉතිරිව ඇති ශේෂ මුදල වහාම පියවීමට කටයුතු කල යුතුය.

09. සියලුම සුදුසුකම් ලත් සේවකයින් ගෘහ භාණ්ඩ අත්තිකාරම් ලබා ගැනීම සඳහා ණය අයදුම්පත සමග තමා සේවය කරන ආයතනයේ ඇපකරුවන් දෙදෙනකු විසින් ගෞරවනාමයෙන් කරනු ලබන ප්‍රකාශය, ප්‍රකාශ දෙකකින් ද සම්පූර්ණ කර එවිය යුතුය.

10. ණය පහසුකම් මත ගනු ලබන භාණ්ඩ වල වටිනාකම රු.100,000/-(එක් ලක්ෂය) ඉක්මවන අවස්ථාවලදී එම වැඩිවන මුදල ගෙවා සංස්ථාවෙන් ලබා ගන්නා ලද කුවිතාන්සිය ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කල යුතුය.

11. ණය අයදුම්කරු සංස්ථාවේ ප්‍රදර්ශණාගාරයක් වෙතින් ගෘහ භාණ්ඩ තෝරාගෙන ප්‍රදර්ශණාගාර කළමණාකරු වෙතින් එම භාණ්ඩවල විස්තර හා මිළ ගනන් සහතික කල ලිපියක් සමග ආසන්නතම මාසයේ වැටුප් විස්තර සමග ආයතන ප්‍රධානියා මගින් අදාල ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කල යුතුය.

12. තමා සේවය කරන ආයතනයෙන්/ඒකකයෙන් වෙනත් ඒකකයකට ස්ථාන මාරුවක්ලබා ගන්නේ නම් එසේ ස්ථාන මාරුවී යාමට ප්‍රථම ඒ බැව් (ස්ථාන මාරුවී යන ස්ථානයේ ලිපිනය, දිනය, දුරකථන අංකය යනාදී විස්තර) රාජ්‍ය දැව සංස්ථාවේ නි.සාමාන්‍යාධිකාරී (අලෙවි) වෙත ආයතන ප්‍රධානියා/ අංශ ප්‍රධානියා මගින් එවිය යුතුය.

13. එමෙන්ම පෞද්ගලික ලිපිනයේ වෙනසක් සිදුකරන්නේ නම් පෞද්ගලික ලිපිනය, දුර කථනය අංකය යනාදි විස්තර අදාල ණය කරු විසින් දැන්විය යුතුය. එමෙන්ම ඇපකරු එම අවස්ථාවේ සේවය කල ස්ථානයත්, ස්ථාන මාරුව හෝ මියගිය විටකදී හෝ සේවකයා ඉවත්වී සිටී නම් ඒ බැව් දැන්විය යුතු අතර, නව ඇපකරුවන් ඒ වෙනුවට නොපමාව ඉදිරිපත් කල යුතුය.

14. ණය මුදල පියවීම සඳහා නියමිත වාරිකය සෑම මසකම අදාල වැටුප් දිනට හෝ ඊට ප්‍රථම ඒ සඳහා සභාපති, රාජ්‍ය දැව සංස්ථාව නමින් ලියන ලද චෙක්පතකින් ගෙවීම කල යුතුය. මෙම චෙක්පත ගෙවීම කිරීමේදී අමුණා ඇති ආකෘතියට අනුව පුරවන ලද ආවරණ ලිපියක් සහිතව අදාල චෙක්පත "සභාපති, රාජ්‍ය දැව සංස්ථාව" නමින් ලියා " නි.සාමාන්‍යාධිකාරී (අලෙවි), රාජ්‍ය දැව සංස්ථාව අංක 82, සම්පත්පාය, රජමල්වත්ත පාර, බත්තරමුල්ල" යන ලිපිනයට එවිය යුතුය.

15. සෑම මසකම අදාල ණය වාරිකය සඳහා නියමිත මුදල "සභාපති - රාජ්‍ය දැව සංස්ථාව" නමින් ලියන ලද චෙක්පතක් මගින් ගෙවීමට එකග වන බවට ආයතන ප්‍රධානියාගේ ලිපියක් ද අයදුම් පත්‍රය සමග ඉදිරිපත් කල යුතුය.

16. මෙම ණය පහසුකම මත භාණ්ඩ මිලදී ගැනීමට අදාලව සංස්ථාව සමග ගිවිසුමකටද එළඹිය යුතුය.

**සභාපති**
**රාජ්‍ය දැව සංස්ථාව**